**ශීර්ෂය 293   රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව**
**----------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**
---------------------

**1.1** **තත්ත්වාගණනය කළ මතය**
----------------------------------

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 අගෝස්තු 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 සැප්තැම්බර් 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
-------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.2 (අ) සහ 1.6.2 (ආ) ඡේදවල නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවේ ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශේෂ පිරික්සුම අනුව වර්ෂය තුළ වෙනත් ලැබීම් රු.346,625,662 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව එම ලැබීම් රු.346,962,149 ක් වූයෙන් රු.336,487 ක වෙනසක් නිරීක්ෂණය විය. | ශේෂ පිරික්සුම අනුව ආදායම් නොවන ලැබීම රු.346,962,149 ක් වේ. එය කාර්යසාධන ප්‍රකාශය අනුව නිවැරදිය. | වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතු වේ. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|
| (අ) මු.රෙ. 891(i) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මෙම ලේඛන හා පොත්පත් විධිමත්ව සහ යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ආ) මු.රෙ. 110 ප්‍රකාරව හානි පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. | මෙම ලේඛන හා පොත්පත් විධිමත්ව සහ යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | මු.රෙ.110 හි විධිවිධාන ප්‍රකාරව ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **(අ)** | පුනරාවර්තන වැය විෂයයන් 03 ට අදාළ රු.14,500,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදන මුදලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.8,692,131 ක මුදලක් එනම් ශුද්ධ ප්‍රතිපාදිත මුදලින් සියයට 85 ත් සියයට 28 ත් අතර ප්‍රතිශතයක් උපයෝජනය කර නොතිබුණි. | 2020 වර්ෂයේ මාර්තු මස සිට කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් විවිධ සීමා කිරීම් සහිතව කාර්යාල කටයුතු කර ගෙන යාමට සිදු විය. ඒ හේතුවෙන් කාර්යාල කටයුතු සඳහා වැය වන පුනරාවර්තන වියදම් අවම මට්ටටක පවත්වා ගැනීමට හැකි වීම නිසා ඇති වූ ඉතිරි වීමකි. | ලබාදී ඇති පරිදි ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කළ යුතු වේ. |
| **(ආ)** | අංක 293-2-1-2507 දරන (පර්යේෂණ සහ සංවර්ධන) ප්‍රාග්ධන වැය විෂය සඳහා වෙන් කරන ලද රු.15,000,000 ක ප්‍රතිපාදිත මුදලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.5,589,294 ක මුදලක් උපයෝජනය කර නොතිබූ අතර, එය ප්‍රතිපාදන මුදලින් සියයට 37 ක ප්‍රතිශතයක් වී තිබුණි. | රටේ පැවති වසංගත තත්ත්වය හමුවේ රට වසා දැමීම සහ සංචරණ සීමා නීති හමුවේ වුවද රු.9,410,706.35 ක වියදමක් දරමින් 2507 වැය විෂය යටතේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් 62.7% ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගත් බව කාරුණිකව සඳහන් කරමි. | ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය සඳහා වසර ආරම්භයේ සිට ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xix පරිච්ඡේදය 6.2 වගන්තිය අනුව නිල නිවාසවල පදිංචිව සිටින නිලධාරීන් විශ්‍රාම යාමේදී එම නිල නිවාසවලින් ඉවත්ව යා යුතු විය. එහෙත් රත්නපුර සහ කළුතර දිස්ත්‍රික්කවල නිල නිවාස දෙකක පදිංචි සිටි රබර් සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු පිළිවෙලින් 2017 ජුනි සහ 2015 දෙසැම්බර් 13 දින සිට විශ්‍රාම ගොස් සිටි නමුත් සමාලෝචිත වර්ෂය වන විටත් එම නිල නිවාස වලින් ඉවත් වී ආපසු බාරදීමට කටයුතු කර නොතිබුණි. | රත්නපුර (ගැටහැත්ත නිල නිවස) හා කළුතර (මතුගම නිල නිවාස) දිස්ත්‍රික්කවල විශ්‍රාම යාමෙන් පසුවත් නිල නිවාස වල රැඳී සිටින විශ්‍රාමලත් රබර් සංවර්ධන නිලධාරීන් එම නිවාස වලින් ඉවත් කරවීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යාමේදී එම ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවීම ගැටලුවක් වී ඇත. මේ වනවිට ගැටහැත්ත නිල නිවාසය පිහිටි ඉඩම ප්‍රාදේශිය ලේකම් විසින් දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇත. එම නිසා නඩු පැවරීම් කටයුතු සඳහා අමාත්‍යාංශ නීති නිලධාරී වෙත යොමු කර ඇත. | නිල නිවාසවල පදිංචිව සිටින නිලධාරීන් විශ්‍රාම ගැන්වීමට පෙර නිල නිවාස ආපසු භාර ගැනීමට අවශ සියලු කටයුතු සලසා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය භාරයයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ රබර් වගා කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය පිළිබඳව සංඛ්‍යා ලේඛන පවත්වා ගත යුතු වන අතර සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා රු.5,000,000 ක් ප්‍රතිපාදනය කර තිබුණ ද එම කාර්යය ඉටුකර නොතිබුණි. | වසර පුරා අවස්ථා කිහිපයකදී රට පුරා ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පැනවූ සංචරණ සීමා හා නිරෝධායන නීති හේතුවෙන් අදාළ ක්‍රියාකාරකම සිදු කිරීමට නොහැකි වූ ඇති බව කාරුණිකව සඳහන් කරමි. | රබර් වගා කර ඇති මුළු ඉඩම් ප්‍රමාණය පිළිබඳව නිවැරදි සංඛ්‍යා ලේඛන පවත්වා ගත යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබා නොගැනීම

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | සමාලෝචිත වර්ෂයේදී කුඩා රබර් වතු හිමියන්ගේ හා වැවිලි සමාගම්වල පිළිවෙලින් ඉඩම් හෙක්ටයාර් 512 ක හා 820 ක රබර් නැවත වගා කිරීමට අපේක්ෂා කර තිබුණ ද ඉන් නැවත වගාකර තිබුණේ ඉඩම් හෙක්ටයාර් 456 ක් හා හෙක්ටයාර් 499 ක් පමණි. ඒ අනුව ඉටු නොකළ ප්‍රමාණය පිළිවෙලින් සැලසුම් කළ ප්‍රමාණයෙන් සියයට 10 ක් හා සියයට 40 ක් වී තිබුණි. | කුඩා රබර් වතු ඉලක්කගත ප්‍රමාණයෙන් හෙක්ටයාර 456.68 ක් සහ වතු සමාගම් එම ඉලක්කගත ප්‍රමාණයෙන් හෙක්ටයාර 498.73 ක් ලෙස පැළ සිටුවා ඇති බවත්, ඒ අනුව ඉටු කළ ප්‍රමාණය සැලසුම් කළ ප්‍රමාණයෙන් පිළිවෙලින් 87% ක් හා 60% ක් වේ. | රබර් නැවත වගා කිරීම් ඉලක්ක සම්පූර්ණ කර ගත යුතුය. |
| **(ආ)** | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ සහනාධාර යටතේ දිස්ත්‍රික්ක 15 ක ඉඩම් හෙක්ටයාර් 260 ක් නව වගා කිරීමට සැළසුම් කර තිබුණද ඉඩම් හෙක්ටයාර් 190 ක් පමණක් වගා කිරීම සිදුකර තිබුණි. ඒ අනුව ඉටු නොකළ ප්‍රමාණය සැළසුම් කළ ප්‍රමාණයෙන් සියයට 26 ක් වී තිබුණි. | 2020 වර්ෂයේ කොරෝනා වසංගත තත්ත්වයක් රට පුරා පැතිර යාමෙන් ඇති වූ අහිතකර තත්ත්වයන් හේතුවෙන් ලබා දී තිබූ නැවත වගා සහ අලුත් වගා ඉලක්කගත බිම් ප්‍රමාණයන් සැළසුම් කළ පරිදි අදාළ ප්‍රතිශතයන් කරා ළඟා වීමට නොහැකි වී ඇති බව කාරුණිකව පෙන්වා දෙමි. | රබර් නව වගා කිරීමේ සැලසුම් සම්පූර්ණ කළ යුතුය. |
| **(ඇ)** | කුඩා වතු අංශය විසින් රබර් නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ නැවත වගාවන් සඳහා ඉඩම් හෙක්ටයාර් 771 ක් වෙනුවෙන් වගාකරුවන් 966 දෙනෙකු වෙත බලපත්‍ර නිකුත් කර තිබුණු නමුත් ඉඩම් හෙක්ටයාර් 456 ක බලපත්‍ර ලාභීන් 640 දෙනෙකු පමණක් නැවත වගාව සිදුකර තිබුණි. ඒ අනුව බලපත්‍ර නිකුත් කළ ප්‍රමාණයෙන් සියයට 33 ක් වගාව සිදු කර නොතිබුණි. | -එම- | සැලසුම්කළ ඉලක්ක ලබා කර ගත යුතුය. |

## 3.3 රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මු. රෙ. 880 (i) යටතේ දක්වා ඇති කාණ්ඩවලට අයත් නිලධාරීන් සංඛ්‍යාව හඳුනාගෙන ඇප තැන්පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් කොටසක් ඇප තබා ඇති අතර, අනෙකුත් නිලධාරීන්ගෙන් ඇප තැබීමේ කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබීම කටයුතු කළ යුතුය. |

## 3.4 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව සතු වාහන 08 කට අදාළව සිදුව තිබූ අනතුරු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අලාභ මුළු වටිනාකම රු.2,466,640 ක් වූ අතර මෙම අලාභයන් මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අප දෙපාර්තමේන්තුව සතු වාහන අතරින් අනතුරට පත්වීම හේතුවෙන් සිදුවී ඇති අලාභයන් සම්බන්ධයෙන් මේ වන විට වාහන කිහිපයක නීතිමය කටයුතු අවසන් වී නොමැති අතර, මු.රෙ. පරීක්ෂණ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි. | වාහන සඳහා වූ අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 අනාර්ථික ගනුදෙනු**

-----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේ දී පර්චස් 75 ක රු.66,700,000 ක් වටිනා ඉඩමක් මිල දී ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු.59,304,347 ක් ගෙවා තිබුණි. එසේම එම ඉඩමේ ගොඩනැගිල්ල ඉදිකිරීමට සහ සැලසුම සකස් කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු.150,000 ක් 2009 වර්ෂයේදී ගෙවීම් කර රු.මිලියන 249 ක ඇස්තමේන්තුවක්ද සකස් කර ගෙන තිබුණි. මෙම මූලික කටයුතු අවසන් කර වර්ෂ 11 ක් පමණ ගත වී ඇතත් හිඟ මුදල ගෙවා දෙපාර්තමේන්තුව වෙත ඉඩම පවරා ගැනීමේ කටයුතු සහ ඉඩමේ ඉදිකිරීම් කටයුතු මෙතෙක් සිදු කර නොතිබුණි. 2017 පෙබරවාරි මාසයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම දෙපාර්තමේන්තුව කුලියට ගත් පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යමින් තිබුණි. | නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් මිල දී ගත් ඉඩම විධිමත්ව පවරා ගැනීමට 2019 වර්ෂයේදී කටයුතු කළ අතර, ඒ අනුව 2020.08.28 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉඩම පවරා දීමට ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කර ඇත. ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම පරීක්ෂා කර මැනීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඉඩම මැනුම් කර භාරදීමෙන් පසු ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බව කාරුණිකව සඳහන් කරමි. | ඉඩම පවරා ගැනීමේ කටයුතු සහ ගොඩනැගිල්ල ඉදිකර ගැනීමේ කටයුතු අප්‍රමාදව ඉටුකර ගත යුතුය. |

**3.6 කළමනාකරණ දුර්වලතා**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | රබර් නැවත වගාව සහ නව වගාව සහනාධාර ක්‍රමය යටතේ දිස්ත්‍රික්ක 9 ක රබර් වගා සහනාධාර ලබාදුන් වගාකරුවන් 9398 දෙනෙකුගෙන් වගාකරුවන් 603 | රබර් වගාකරුවන්ගෙන් ගෙවන ලද සහනාධාර මුදල් අය කිරීම පිළිබඳව ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව දැනට නොමැති වුවත්, රබර් නැවත වගා | රබර් වගා සහනාධාර ලබාගත් වගාව අත්හැර දැමූ වගා කරුවන් ගෙන් අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙනෙකු වගාව අත්හැර දැමීම නිසා රු.21,702,451 ක් දෙපාර්තමේන්තුවට අය විමට තිබුණි. | උපදේශක මණ්ඩලය යළි ක්‍රියාත්මක කිරීම හරහා, සහනාධාර මුදල් අය කර ගැනීම සම්බන්ධව දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇති බව දන්වා සිටිමි. | |
| (ආ) | දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස 77 න් නිල නිවාස 11 ක් අලුත්වැඩියා කළ යුතු මට්ටමේ පැවති අතර, එම නිවාස වර්ෂ 13 ක කාලයක් අභාවිතව පැවතුණි. එසේම නිල නිවාස 23 ක් නිලධාරීන්ට ලබා නොදී කාර්යාල ලෙස පවත්වා තිබුණි. | අදාළ වර්ෂයේ සිදුකළ යුතුයැයි හඳුනාගන්නා අලුත්වැඩියාවන් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් මාස 06 සිට වසර 13 අතර කාලයක් මෙම අලුත්වැඩියාවන් ප්‍රමාද වී ඇති බවත්, ඒ නිසා භාවිතයෙන් තොරව පැවති බවත් සඳහන් කරමි. | නිල නිවාස අලුත් වැඩියාවන් සිදුකර නිලධාරීන්ගේ භාවිතයට ලබාදීමට කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 478 ක් වූ අතර ඉන් තනතුරු 96 ක් පුරප්පාඩු පැවතිණි. එම පුරප්පාඩු අතුරින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අධ්‍යක්ෂ තනතුරු 5 ක් ද, ගණකාධිකාරී තනතුරු 02 ක් ද පුරප්පාඩු වී තිබුණි. | පරිපාලන සේවයේ අධ්‍යක්ෂ තනතුරු 5 පූර්ණකාලීනව වැඩ බැලීමේ පදනම මත සේවය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවිය යුතුය. |
| **(ආ)** | දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාවලියට සෘජුවම දායක වන ජ්‍යෝෂ්ඨ රබර් සංවර්ධන නිලධාරීන් 10 ක් ද රබර් සංවර්ධන නිලධාරීන් 50 ක් ද පුරප්පාඩු පැවතීම ව්‍යාපෘති කටයුතුවල ඉලක්ක ලඟා කර ගැනීම දුෂ්කරවීමට බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | ජ්‍යෝෂ්ඨ රබර් සංවර්ධන නිලධාරී පුරප්පාඩු 10ක් හා රබර් සංවර්ධන නිලධාරී පුරප්පාඩු 50ක් බඳවාගැනීමට අනුමැතිය ඉල්ලා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත හා අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති අතර, එම අනුමැතිය ලද පසු මෙම පුරප්පාඩු සඳහා නිලධාරීන් 2021 වර්ෂයේදී බඳවා ගැනීමට අපේක්ෂිතය. | -එම- |